සැ. යු.- මෙවර පළවන ගැසට් පත්‍රයේ V කොටසේ 2008 වර්ෂයේ අප්‍රේල් - ජුනි කාර්තුවට අදාලව මුද්‍රණ ශිල්පීන්ගේ හා ප්‍රකාශකයින්ගේ ආඥා පනත යටතේ ලියාපදිංචි වූ පොත් නාමාවලියක් ඉංග්‍රීසි භාෂාවෙන් පළ වේ.



# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,762 - 2012 ජුනි මස 08 වැනි සිකුරාදා - 2012.06.08**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස : (IIඅ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)



| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු - ඇබෑර්තු ... ... ... ... | 758 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 760 |



*සැ. යු.* - (i) දේශීය ආදායම් (සංශෝධන) පනත් කෙටුම්පත 2012 මාර්තු මස 09 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(ii) හිස්බුල්ලාහ් පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2012 මාර්තු මස 30 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(iii) දක්ෂිණ ලංකා තෘතියික අධ්‍යාපන හා නායකත්ව පුහුණු පීඨය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2012 අප්‍රේල් මස 20 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් *භාරගැනීම ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2012 ජුනි මස 15 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2012 ජුනි මස 01 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2012 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.


755 - B 80617 — 8,915 (2012/06)
B1-

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

**2. සේවා කොන්දේසි - සාමාන්‍ය :**

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

**3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි**

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අතිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමඟම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

**4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි**

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

**5. යුද්ධ සේවා අනුග්‍රහය**

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

**6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු**

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දුරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම**

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

**8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය**

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

# විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,
(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,
(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,
(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාගශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. :—

(i) විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii) යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන, රෙදි කෑලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

**විභාග කොමසාරිස් ජනරාල්.**

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු - ඇබෑර්තු

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු — කළුතර දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01. ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැලකිල්ල ලබන අය ද විය යුතු ය.

02. මෙම තනතුර සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයට ම ඉල්ලුම් කළ හැකිය.

03. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 30 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 60 ට නොවැඩි විය යුතු ය.

04. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතු ය.

05. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකිය.

06. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් රෙජිස්ට්‍රාර් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැකිය.

07. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2012 ජූනි මස 30 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2012 මැයි මස 21 වැනි දින,
බත්තරමුල්ල,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/A3,
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

#### උපලේඛනය

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| කළුතර | මිල්ලනිය | යාලගල කොට්ඨාසයේ උප්පැන්න හා මරණ සහ රයිගම කෝරළය කොට්ඨාසයේ විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කළුතර |



## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු — ගම්පහ දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01. ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැලකිල්ල ලබන අය ද විය යුතු ය.

02. මෙම තනතුර සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයට ම ඉල්ලුම් කළ හැකිය.

03. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 30 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 60 ට නොවැඩි විය යුතු ය.

04. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතු ය.

05. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකිය.

06. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් රෙජිස්ට්‍රාර් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැකිය.

07. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2012 ජූලි මස 09 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2012 මැයි මස 21 වැනි දින,
බත්තරමුල්ල,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/A3,
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

#### උපලේඛනය

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| ගම්පහ | දොම්පෙ | කැරගල කොට්ඨාසයේ උප්පැන්න, මරණ හා නැගෙනහිර සියනෑ කෝරළේ කොට්ඨාසයේ විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ගම්පහ |

| දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර | ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය |
|---|---|---|---|
| ගම්පහ | දිවුලපිටිය | යටිගහ උතුර කොට්ඨාසයේ උප්පැන්න, මරණ හා හාපිටිගම් කෝරළය කොට්ඨාසයේ විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ගම්පහ |

06-276

---

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු — ගම්පහ දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01. ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැලකිල්ල ලබන අය ද විය යුතු ය.

02. මෙම තනතුර සඳහා මුස්ලිම් පුරුෂ පක්ෂයට පමණක් ඉල්ලුම් කළ හැකිය.

03. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 30 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 60 ට නොවැඩි විය යුතු ය.

04. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතු ය.

05. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකිය.

06. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් රෙජිස්ට්‍රාර් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැකිය.

07. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2012 ජූලි මස 09 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2012 මැයි මස 21 වැනි දින,
බත්තරමුල්ල,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/A3,
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

### උපලේඛනය

| දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර | ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය |
|---|---|---|---|
| ගම්පහ | මහර | බටහිර සියනෑ කෝරළය කොට්ඨාසයේ අක්බාර් ටවුන් ප්‍රදේශයේ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ගම්පහ |

06-277

---

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### දෙමළ භාෂාවෙන් විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු — කොළඹ දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01. ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැලකිල්ල ලබන අය ද විය යුතු ය.

02. මෙම තනතුර සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයට ම ඉල්ලුම් කළ හැකිය.

03. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 30 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 60 ට නොවැඩි විය යුතු ය.

04. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතු ය.

05. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකිය.

06. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් රෙජිස්ට්‍රාර් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැකිය.

07. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2012 ජූලි මස 09 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2012 මැයි මස 21 වැනි දින,
බත්තරමුල්ල,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/A3,
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

උපලේඛනය

| දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර | ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය |
|---|---|---|---|
| කොළඹ | තිඹිරිගස්යාය | තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ උප්පැන්න, | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් |

06-441

| දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර | ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය |
|---|---|---|---|
| | | මරණ (දෙමළ මාධ්‍ය) වෛද්‍ය රෙජිස්ට්‍රාර් ධූරය. | ලේකම් කාර්යාලය, වේල්ල වීදිය, කොළඹ 12. |

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

**අධිකරණ සේවා කොමිෂන් සභාව**

**අධිකරණ කළමනාකරණ සහකාර සේවයේ අධිකරණ ලඝු ලේඛක (සිංහල/ඉංග්‍රීසි) II ශ්‍රේණිය සහ අධිකරණ යතුරු ලේඛක (සිංහල/ඉංග්‍රීසි) II ශ්‍රේණිය තනතුරු සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය — 2012**

අධිකරණ කළමනාකරණ සහකාර සේවයේ අධිකරණ ලඝු ලේඛක (සිංහල/ඉංග්‍රීසි) II ශ්‍රේණිය සහ අධිකරණ යතුරු ලේඛක (සිංහල/ඉංග්‍රීසි) II ශ්‍රේණිය තනතුරු සඳහා පහත සඳහන් සුදුසුකම් ඇති තැනැත්තන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.

03. වැටුප් ක්‍රමය - මසකට රු. 15,610 - 10x170-6x240-14x320-රු. 23,230 වැටුප් පරිමාණයක් මෙම තනතුරට අයත්ය. මෙම තනතුරේ ආරම්භක වැටුප් පියවර රු. 16,290ක් වේ.

04. වයස, අයදුම්පත් භාරගන්නා අවසාන දිනට අයදුම්කරුවන් අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 30ට නොවැඩි විය යුතුයි. (රජයේ සේවයේ නියුතු නිලධාරීන්ට උපරිම වයස් සීමාව අදාල නොවේ.)

05. සුදුසුකම්: (අධ්‍යාපන)

අයදුම්කරුවන්ට පහත සඳහන් සුදුසුකම් තිබිය යුතුය.

**ලඝුලේඛක සිංහල/ඉංග්‍රීසි තනතුර සඳහා**

අ.පො.ස. (සා.පෙළ) දෙවරකට නොවැඩි වාර ගණනකදී ගණිතය ඇතුළුව විෂයයන් 06ක් සමත් වී තිබිය යුතු අතර භාෂාව ඇතුළුව විෂයයන් 05කට සම්මාන සමාර්ථයන් ලබා තිබීම සහ ජාතික තරුණ සේවා සභාව, ජාතික ආධුනිකත්ව හා පුහුණු කිරීමේ අධිකාරිය, කාර්මික විද්‍යාල හෝ රජයේ ලියාපදිංචි පුහුණු ආයතනයක ලඝු ලේඛණ හා යතුරු ලේඛණ (සිංහල/ඉංග්‍රීසි) පාඨමාලාවක් සාර්ථකව හදාරා අවසන් කර තිබිය යුතුය.

**යතුරු ලේඛක සිංහල/ඉංග්‍රීසි තනතුර සඳහා**

අ.පො.ස. (සා.පෙළ) දෙවරකට නොවැඩි වාර ගණනකදී ගණිතය ඇතුළුව විෂයයන් 06ක් සමත් වී තිබිය යුතු අතර භාෂාව ඇතුළුව විෂයයන් 04කට සම්මාන සාමාර්ථයන් ලබා තිබීම සහ ජාතික තරුණ සේවා සභාව, ජාතික ආධුනිකත්ව හා පුහුණු කිරීමේ අධිකාරිය, කාර්මික විද්‍යාල හෝ රජයේ ලියාපදිංචි පුහුණු ආයතනයක යතුරු ලේඛණ හා යතුරු ලේඛණ (සිංහල/ඉංග්‍රීසි) පාඨමාලාවක් සාර්ථකව හදාරා අවසන් කර තිබිය යුතුය.

06. ලඝු ලේඛක හා යතුරු ලේඛක තනතුරු සඳහා වෙන වෙනම විභාගයක් පවත්වනු ලබන අතර එම විභාගයේ ප්‍රතිඵල මත නියමිත ලකුණු මට්ටමට එළඹ ඇති තැනැත්තන් වාචික පරීක්ෂණයකින් පසු බඳවා ගනු ලැබේ. එලෙස තෝරා ගන්නා ලද අයදුම්කරුවන් සේවයට බඳවා ගැනීමෙන් පසු දිවයිනේ කවර ප්‍රදේශයක වුවද සේවය කිරීමට බැඳී සිටිය යුතුය.

07. නිර්දේශ පත්‍රය :

*ලඝු ලේඛණය (සිංහල)*

(අ) සිංහල භාෂාව හා වාක්‍ය රචනය
(ආ) සිංහල ලඝු ලේඛණය - විනාඩියකට වචන 70ක වේගයෙන් විනාඩි 05ක් තුල කියවනු ලබන පාඨයක් ලඝු ලේඛණය කර, එය විනාඩියකට වචන 08ක වේගයෙන් පිටපත් කිරීම
(ඇ) සිංහල යතුරු ලිවීම - විනාඩියකට වචන 30ක අවම වේගයෙන් විනාඩි 20ක් යතුරු ලිවීම

වාචික පරීක්ෂණය

*ලඝු ලේඛණය (ඉංග්‍රීසි)*

(අ) ඉංග්‍රීසි භාෂාව හා වාක්‍ය රචනය
(ආ) ඉංග්‍රීසි ලඝු ලේඛණය - විනාඩියකට වචන 100ක වේගයෙන් විනාඩි 05ක් තුල කියවනු ලබන පාඨයක් ලඝු ලේඛණය කර, එය විනාඩියකට වචන 10ක වේගයෙන් පිටපත් කිරීම
(ඇ) ඉංග්‍රීසි යතුරු ලිවීම - විනාඩියකට වචන 40ක අවම වේගයෙන් විනාඩි 20ක් යතුරු ලිවීම

වාචික පරීක්ෂණය

යතුරු ලේඛණය (සිංහල)

(අ) සිංහල භාෂාව හා වාක්‍ය රචනය
(ආ) සිංහල යතුරු ලියනය කිරීම - විනාඩියකට වචන 20ක අවම වේගයෙන් විනාඩි 20ක් තුළ

වාචික පරීක්ෂණය

(ඇ) සාමාන්‍ය දැනීම

යතුරු ලේඛණය (ඉංග්‍රීසි)

(අ) ඉංග්‍රීසි භාෂාව හා වාක්‍ය රචනය
(ආ) ඉංග්‍රීසි යතුරු ලියනය කිරීම - විනාඩියකට වචන 40ක අවම වේගයෙන් විනාඩි 20ක් තුළ

වාචික පරීක්ෂණය

(ඇ) සාමාන්‍ය දැනීම

*සටහන :* උත්තර පත්‍ර ලකුණු කිරීමේ දී පිරිසිදුකම හා නිරවද්‍යතාවය සැළකිල්ලට ගනු ලැබේ.

08. මෙම විභාගය සඳහා ඉල්ලුම් කිරීමේ ආදර්ශ අයදුම්පතක් මෙම නිවේදනය අවසානයේ පළකර ඇත. ආදර්ශ අයදුම් පතට අනුකූලව

පමණක් අයදුම්කරුවන් විසින් තමන්ගේ අයදුම්පත් පිළියෙල කර ගැනීම අවශ්‍ය වේ. විභාගය සඳහා අයදුම් කිරීමේ දී පරිපාලන ගාස්තු වශයෙන් ආපසු නොගෙවන රු. 500ක මුදලක් අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම් නමින් මහජන බැංකුවේ වේල්ල වීදිය ශාඛාවේ පවත්වාගෙන යන ගිණුම් අංක 297100199025039 බැර කර ලබා ගන්නා ලදුපත් අයදුම්පත්‍රයේ නියමිත කොටුවේ ඇලවිය යුතුවේ.

09. අයදුම්පත් 2012.07.06 දිනට හෝ එදිනට පෙර ලේකම්, අධිකරණ සේවා කොමිෂන් සභා කාර්යාලය, කොළඹ 12 යන ලිපිනයට ලැබෙන සේ ලේඛනගත තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත බහාලන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙලවරේ විභාගයේ නම සඳහන් කළ යුතුය. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරේ. රජයේ සේවයේ නියුතු නිලධාරීන්ගේ අයදුම්පත් තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මඟින් එවිය යුතු වේ.

10. අයදුම්පත සම්බන්ධව පැනනගින ගැටළු පිළිබඳව අධිකරණ සේවා කොමිෂන් සභාවේ තීරණය අවසාන තීරණය වනු ඇත.

මංජුල තිලකරත්න,
ලේකම්,
අධිකරණ සේවා කොමිෂන් සභාව.

2012 මැයි මස,
කොළඹ 12,
අධිකරණ සේවා කොමිෂන් සභා කාර්යාලයේ දී ය.

**අධිකරණ සේවා කොමිෂන් සභාව**

අධිකරණ කළමනාකරණ සහකාර සේවයේ අධිකරණ ලඝු ලේඛක (සිංහල/ඉංග්‍රීසි) II ශ්‍රේණිය සහ අධිකරණ යතුරු ලේඛක (සිංහල/ඉංග්‍රීසි) II ශ්‍රේණිය තනතුරු සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය — 2012

| විභාග අංකය : (කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණි.) |
|---|

*(සැළකිය යුතුය.—*අයදුම්පත්‍රය නිවැරදිව සහ පැහැදිලිව අයදුම්කරුගේ අත් අකුරින්ම පිරවිය යුතුවේ. අදාල කොටුවල නියමිත අංකය සඳහන් කරන්න.)

01. (i) මුලකුරු සමග අගට යෙදෙන නම :—————.
    (ii) මුලකුරුවලින් හැඳින්වෙන නම් :—————.

02. ස්ත්‍රී පුරුෂ භාවය ඃ ස්ත්‍රී 01
    පුරුෂ 02 [ ]

03. ස්ථිර ලිපිනය :—————.

04. ප්‍රවේශ පත්‍ර එවිය යුතු ලිපිනය :—————.

05. පදිංචි දිස්ත්‍රික්කය :—————.

06. දුරකථන අංකය : | | | | | | | | | | |

07. ජාතික හැඳුනුම්පත් අංකය : | | | | | | | | | | |

08. *(අ)* උපන් දිනය :—————.

    *(ආ)* අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස :
    අවුරුදු :—————. මාස :—————. දින :—————.

09. අයදුම්කරන තනතුරු : [ ]
    1. ලඝු ලේඛක (සිංහල)
    2. ලඝු ලේඛක (ඉංග්‍රීසි)
    3. යතුරු ලේඛක (සිංහල)
    4. යතුරු ලේඛක (ඉංග්‍රීසි)

10. රජයේ සේවයේ නියුක්ත නම්—
    (i) අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව :—————.
    (ii) දැනට දරන තනතුර :—————.
    (iii) එම තනතුරට පත් කරන ලද දිනය :—————.
    (iv) එම තනතුරේ ස්ථිර කරන ලද දිනය හා ලිපි යොමුව :—————.
    (v) කාර්යාලීය ලිපිනය :—————.

11. සුදුසුකම් ඃ
    *(අ)* අධ්‍යාපන සුදුසුකම් ඃ
    (එක් එක් විභාගයේ ප්‍රතිඵල විභාග අංකය සහිතව වෙන් වෙන්ව සඳහන් කරන්න)

    (i) අ.පො.ස. (සා.පෙළ) විභාග ප්‍රතිඵල :

*වර්ෂය :——. විභාග අංකය :——. වර්ෂය :——. විභාග අංකය :——.*

| *අනු අංකය* | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|
| | | |

| *අනු අංකය* | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|
| | | |

    (ii) සුදුසුකම් අ.පො.ස. (උසස් පෙළ)

විභාග අංකය :—————. වර්ෂය :—————.

| *අනු අංකය* | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|
| | | |

    *(ආ)* හදාරා ඇති පාඨමාලාව පිළිබඳ විස්තර :—————.
    *(ගැසට් පත්‍රයෙහි 05 වගන්තිය අනුව ඇතුලත් කරන්න.)*

සටහන ඃ අයදුම්කරුවන් විසින් චක්‍රලේඛයේ සටහන් උපදෙස් පරිදි නියමිත වටිනාකම තැන්පත් කර ලබාගත් රිසිට් පත්‍රය ගැලවිය නොහැකි පරිදි මෙහි අලවන්න.

| |
|---|
| |

ඉහත සඳහන් කරුණු සත්‍ය හා නිවැරදි බවත්, මෙම විභාගය සඳහා පනවා ඇති නීති පිළිපැදීමට එකඟ වන බවත් ප්‍රකාශ කරමි. මෙහි සඳහන් යම්කිසි තොරතුරක් අසත්‍ය බැව් හෝ වැරදි බැව් හෝ මා තෝරා ගැනීමට පෙර දැනගැනීමට ලැබුණහොත් ඒ හේතුවෙන් මා මෙම තනතුරට නුසුදුසු වීමටද මෙම තනතුරට මා පත්කර ගැනීමෙන් පසුව එම වරද දැනගන්නට ලැබුණහොත් කිසිම වන්දි මුදලක් නොගෙවා මා සේවයෙන් පහකරනු ලැබීමටද යටත් වන බැව් මා දනිමි.

—————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :—————.

**දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය**

ඉහත නම් සඳහන් අයදුම්කරු මෙම අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ සේවය කරන බවත්, ඔහු/ඇය විසින් සපයා ඇති තොරතුරු නිවැරදි බවත්, ඔහු/ඇය ඉහත තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් මුදා හැරිය හැකි/නොහැකි බවත් දන්වමි.

—————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.

නම :—————.
නිල මුද්‍රාව :—————.
දිනය :—————.

06-440

## යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය

### ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය

### 2012 දෙවන අධ්‍යයන වර්ෂය සඳහා ආධුනික ආධුනිකාවන් බඳවා ගැනීම - රත්මලාන ජාතික වෘත්තීය පුහුණු ආයතනය

පහත දැක්වෙන පාඨමාලා සඳහා ශ්‍රී ලංකා තරුණ තරුණියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| පාඨමාලා අංකය | පාඨමාලාව (පූර්ණ කාලීන) | NVQ | පුහුණු කාලය (මාස) ආයතනික | වැඩබිම | පාඨමාලා ගාස්තු රු. |
|---|---|---|---|---|---|
| 01 | තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණ ශිල්පී පාඨමාලාව (Information and communication Technology Technician) | NVQL-4 | 06 | 06 | 6,000 |
| 02 | පරිඝණක දෘඩාංග ශිල්පී (Computer Hard Ware Technician) | NVQL -4 | 06 | 06 | 6,000 |
| 03. | ග්‍රැෆික් නිර්මාණ ශිල්පී (Computer Graphic Designer) | NVQL -4 | 06 | 06 | 6,000 |
| 04. | ජාතික තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණ සහතික පත්‍ර පාඨමාලාව (NCICT) (National Certificate information and Communication Technology) | | 06 | 06 | 6,000 |
| 05. | මෝටර් රථ පින්තාරු (Automobile Painter) | NVQL -3 | 06 | 06 | නොමිලේ |
| 06. | ඇළුමිනියම් පිරිසැකසුම් කාර්මික ශිල්පී (Aluminium Fabricator) | NVQL -3 | 06 | 06 | 2,000 |
| 07. | ජංගම දුරකථන අළුත්වැඩියා ශිල්පී (Mobile Phone Repaired) | | 06 | 06 | 10,000 |
| 08. | උද්‍යාන අලංකරණ ශිල්පී (Landscapist) | | 06 | 06 | නොමිලේ |
| 09. | ගුවන්විදුලි හා රූපවාහිනී ආශ්‍රිත උපකරණ කාර්මික ශිල්පී (Fundamental of Electronic and Radio Technician) | NVQ - 4 | 18 | 12 | 3,000 |

*අර්ධකාලීන පාඨමාලා (සති අන්ත හා සන්ධ්‍යාකාලීන)*

| පාඨමාලා අංකය | පාඨමාලාව අර්ධකාලීන | පැය ගණන | පාඨමාලා ගාස්තු රු. |
|---|---|---|---|
| 01 | තොරතුරු තාක්ෂණ සහතික පත්‍ර පාඨමාලාව (Pc Base Application Assistant) | 100 | 7,400 |
| 02 | ග්‍රැෆික් නිර්මාණ ශිල්පී Computer Graphic Design) | 100 | 7,900 |
| 03 | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ශිල්පී පාඨමාලාව (Microsoft IC3) | 120 | 8,500 |
| 04 | පරිඝණක දෘඩාංග ශිල්පී (Computer Hardware) | 125 | 9,900 |
| 05 | ජංගම දුරකථන අළුත්වැඩියා ශිල්පී (Mobile Phone Technician) | 125 | 10,400 |
| 06 | ඇළුමිනියම් පිරිසැකසුම් කාර්මික ශිල්පී | 120 | 9,900 |
| 07 | ගුවන්විදුලි හා රූපවාහිනී අලුත්වැඩියා කාර්මික ශිල්පී (Fundamental of Electronic and Radio Technology) | 125 | 10,400 |
| 08 | විදුලි කාර්මික ශිල්පී (කර්මාන්ත) (Electrician (Industrial) | 125 | 10,400 |
| 09 | විදුලි කාර්මික ශිල්පී (ගෘහස්ත) (Electrician (Domestic) | 100 | 8,400 |
| 10 | මෝටර් කාර්මික ශිල්පී (Overhaul Diesel and Petrol Engine) | 125 | 12,400 |

| පාඨමාලා අංකය | පාඨමාලාව අර්ධකාලීන | පැය ගණන | පාඨමාලා ගාස්තු රු. |
|---|---|---|---|
| 11 | PLC Base Industrial Application PLC (පාදක උපකරණ කාර්මික ශිල්පී) | 125 | 10,400 |
| 12 | යන්ත්‍ර ශිල්පී (Latheman) | 100 | 7,400 |
| 13 | ශීතකරණ හා වායු සමීකරණ යාන්ත්‍රික (Refrigeration and Air Conditioning Machanic) | 125 | 10,400 |

*පාඨමාලා හැදෑරීම සඳහා අවශ්‍ය සුදුසුකම් :*

* අයදුම්පත් ඉදිරිපත් කිරීමේ වයස් සීමාව අවුරුදු 16-30 අතර වේ.

*අවශ්‍ය අධ්‍යාපන සුදුසුකම් :*

* පාඨමාලා අංක 01, 02, 03, 04 සඳහා අ.පො.ස. (සා.පෙළ.) ගණිතය, ඉංග්‍රීසි සම්මාන සහිතව විෂයයන් 06 කින් සමත්ව තිබිය යුතුය.
* පාඨමාලා අංක 09 සඳහා අ.පො.ස. (සා. පෙළ) විෂයයන් 06 කින් සමත්ව තිබීම.
* අනෙකුත් සියළුම පාඨමාලාවන් සඳහා අ.පො.ස. (සා.පෙළ) පෙනී සිටීම ප්‍රමාණවත් වේ.
* අපේක්ෂකයාගේ දැනුම ආකල්ප හා කුසලතා පදනම් කරගෙන ඒ ඒ පාඨමාලා සඳහා අධ්‍යාපන සුදුසුකම් ලිහිල් කිරීම ද සලකා බලනු ලැබේ.

*ඉහත පාඨමාලා හදාරන ඔබට ඔබේ දරුවාට පුහුණු කාලය තුළ ලැබෙන පහසුකම් :*

* දුෂ්කර දුර බැහැර පෙදෙස්වල ආධුනිකයින් සඳහා නේවාසික පහසුකම් (පිරිමි)
* රැකියා ලොව ඉහළ පිළිගැනීමට ලක්වූ ජාත්‍යන්තර මට්ටමේ වෘත්තීය නිපුණතා සහතිකය (NVQ Level)
* වෘත්තීය මාර්ගෝපදේශනය සහ ව්‍යවසායකත්ව දැනුම
* ස්වයං රැකියා ආරම්භ කරන්නන් සඳහා රු. 2,50,000 ණය පහසුකම්
* නායකත්ව හා සෞඛ්‍ය පුහුණු වැඩසටහන්
* සෑම පාඨමාලාවකටම නොමිලේ ඉංග්‍රීසි අධ්‍යාපනය

*විශේෂයි :*

* පුහුණුවෙන් පසු අනිවාර්යෙන්ම රැකියාවක්
* කාර්මික පාඨමාලාවන් සඳහා කාන්තා අයදුම්කාරියන්ට ප්‍රමුඛත්වය
* දුර බැහැර පෙදෙස්වල අයදුම්කරුවන් සඳහා ප්‍රමුඛත්වය

*පාඨමාලා සඳහා අයදුම්පත් යොමු කිරීම :*

* ඔබ හැදෑරීමට කැමති පාඨමාලාව සඳහන් කර ඔබේ පෞද්ගලික තොරතුරු, දක්ෂතා, රුචිකත්වයන්, ඇතුළත් කර ඔබ විසින්ම සකස් කරන ලද අයදුම්පතක් 2012.06.30 වැනි දිනට පෙර පහත ලිපිනයට යොමු කරන්න.

සභාපති,
ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය.

සහකාර අධ්‍යක්ෂ,
ජාතික වෘත්තීය පුහුණු ආයතනය,
අංක 100, කඳවල පාර, රත්මලාන.
දුරකථන අංක : 011-2638850
ඊමේල් : NVTIRatmalana@vtasl.gov.lk

06-442

---

**යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය**

ශ්‍රී ලංකා වෘත්තිය පුහුණු අධිකාරිය - කොළඹ දිස්ත්‍රික්කය

**2012 වසර දෙවන අර්ධය සඳහා ආධුනික ආධුනිකාවන් බඳවා ගැනීම**

ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ කොළඹ දිස්ත්‍රික්කය තුළ ඇති පහත සඳහන් මධ්‍යස්ථානවල පැවැත්වෙන පූර්ණ කාලීන පාඨමාලා සඳහා ආධුනික ආධුනිකාවන් බඳවා ගැනීම සිදු කරනු ලැබේ.

| අංකය | මධ්‍යස්ථානය | පාඨමාලාව | පාඨමාලා ස්වභාවය | කාලය (මාස) ආයතනික | කර්මාන්තගත | පාඨමාලා ගාස්තුව |
|---|---|---|---|---|---|---|
| 01 | රාජගිරිය දිස්ත්‍රික් වෘත්තීය | ස්වර්ණාභරණ ගල් අල්ලන්නා | NVQ L III | මාස 06 | මාස 06 | 2,000 |
| | පුහුණු මධ්‍යස්ථානය | උද්‍යාන අලංකරණය | - | මාස 06 | මාස 06 | නොමිලේ |
| | අංක 03, පරණ පාර | රූපලාවන්‍ය ශිල්පී ජාතික ඩිප්ලෝමාව | NVQ L IV | මාස 03 | මාස 03 | 10,000 |
| | රාජගිරිය | කොණ්ඩා සැකසුම් ශිල්පය ජාතික ඩිප්ලෝමාව | NVQ L IV | මාස 03 | මාස 03 | 15,000 |
| | | වෘත්තීය සුපවේදී | NVQ L III | මාස 06 | මාස 06 | 4,000 |
| | | භෝජනාගාර සහයක | - | මාස 06 | මාස 06 | 3,000 |
| 02 | හෝමාගම වෘත්තීය පුහුණු | ඇළුමිණියම් පිරිසැකසුම් තාක්‍ෂණය | NVQ L III | මාස 06 | මාස 06 | 2,000 |
| | මධ්‍යස්ථානය කැන්දලන්ද, | විදුලි තාක්‍ෂණය (ගෘහස්ථ) | NVQ L III | මාස 06 | මාස 06 | නොමිලේ |
| | හෝමාගම | වෘත්තීය ඇඳුම් මැසීම (කාන්තා හා ළමා) | NVQ L IV | මාස 06 | මාස 06 | 2,000 |
| 03 | හොන්නන්තර වෘත්තීය පුහුණු | විදුලි තාක්‍ෂණය (ගෘහස්ථ) | NVQ L III | මාස 06 | මාස 06 | නොමිලේ |
| | මධ්‍යස්ථානය, | තොරතුරු තාක්‍ෂණ ශිල්පී | NVQ L IV | මාස 06 | මාස 06 | 6,000 |
| | විජයනන්දනාරාමය, | සූපවේදී | NVQ L III | මාස 06 | මාස 06 | 2,000 |
| | හොන්නන්තර, පිළියන්දල | | | | | |
| 04 | පාදුක්ක වෘත්තීය පුහුණු | ඉලෙක්ට්‍රොනික උපකරණ තාක්‍ෂණය | NVQ L IV | මාස 18 | මාස 12 | 3,000 |
| | මධ්‍යස්ථානය, | ජාතික තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණ ශිල්පී සහතික පත්‍ර පාඨමාලාව | - | මාස 06 | මාස 06 | 6,000 |
| | ගලගෙදර, පාදුක්ක | වෘත්තිය බේකරි ශිල්පය | NVQ L IV | මාස 06 | මාස 06 | 3,000 |
| | | ඇඳුම් මැසීම (පිරිමි) | NVQ L IV | මාස 06 | මාස 06 | 1,000 |
| 05 | එළමලවල වෘත්තීය පුහුණු | ඉදිකිරීම් තාක්‍ෂණ (ජල නල) | NVQ L III | මාස 06 | මාස 06 | නොමිලේ |
| | මධ්‍යස්ථානය | පෑස්සුම් | NVQ L III | මාස 06 | මාස 06 | නොමිලේ |
| | එළමලව, තුම්මෝදර | | | | | |
| 06 | කළුබෝවිල වෘත්තීය පුහුණු | ඇඟළුම් තත්ව පාලක | NVQ L III | මාස 06 | මාස 06 | නොමිලේ |
| | මධ්‍යස්ථානය | රූපලාවන්‍ය ජාතික සහතිකය | NVQ L IV | මාස 03 | මාස 03 | 6,000 |
| | අංක 64, ප්‍රතිබිම්භාරාම පාර, | කොණ්ඩා සැකසුම් ජාතික සහතිකය | NVQ L IV | මාස 03 | මාස 03 | 9,000 |
| | කළුබෝවිල, දෙහිවල | | | | | |
| 07 | කෝට්ටේ නිපොන් වෘත්තීය | පරිගණක දෘඩාංග තාක්‍ෂණය | NVQ L IV | මාස 06 | මාස 06 | 6,000 |
| | පුහුණු මධ්‍යස්ථානය, | තොරතුරු තාක්‍ෂණ ශිල්පී | NVQ L IV | මාස 06 | මාස 06 | 6,000 |
| | මහින්දාරාම පාර, | | | | | |
| | ඇතුල්කෝට්ටේ | | | | | |
| 08 | මහරගම වෘත්තීය පුහුණු | පරිගණක චිත්‍රක නිර්මාණකරු | NVQ L IV | මාස 06 | මාස 06 | 6,000 |
| | මධ්‍යස්ථානය, | තොරතුරු තාක්‍ෂණ ශිල්පී | NVQ L IV | මාස 06 | මාස 06 | 6,000 |
| | මහමේඝ පෙදෙස, මහරගම | ඇඳුම් මැසීම (කාන්තා හා ළමා) | NVQ L IV | මාස 06 | මාස 06 | 1,000 |
| 09 | සීතාවක වෘත්තීය පුහුණු | අධිවේගී මහන යන්ත්‍ර ක්‍රියාකරු | - | මාස 1 1/2 | මාස 1 1/2 | නොමිලේ |
| | මධ්‍යස්ථානය, | විදුලි මෝටර් එතුම් තාක්‍ෂණය | NVQ L III | මාස 06 | මාස 06 | නොමිලේ |
| | සීතාවක කාර්මික ජනපදය | | | | | |
| | කර්මාන්ත පුරය, අවිස්සාවේල්ල | | | | | |
| 10 | වැල්ලවත්ත වෘත්තීය පුහුණු | පරිගණක දෘඩාංග තාක්‍ෂණය | NVQ L IV | මාස 06 | මාස 06 | 6,000 |
| | මධ්‍යස්ථානය, | විදුලි තාක්‍ෂණය (ගෘහස්ත) | NVQ L III | මාස 06 | මාස 06 | නොමිලේ |
| | අංක 48, බෝධිරුක්ඛාරාම මාවත | තොරතුරු තාක්‍ෂණ ශිල්පී | NVQ L IV | මාස 06 | මාස 06 | 6,000 |
| | වැල්ලවත්ත | සූපවේදී | NVQ L III | මාස 06 | මාස 06 | 2,000 |
| 11 | පන්නිපිටිය වෘත්තීය පුහුණු | රූපලාවන්‍ය ජාතික සහතිකය | NVQ L IV | මාස 03 | මාස 03 | 6,000 |
| | මධ්‍යස්ථානය Y. M. B. A. | කොණ්ඩා සැකසුම් ජාතික සහතිකය | NVQ L IV | මාස 03 | මාස 03 | 9,000 |
| | ගොඩනැගිල්ල, පන්නිපිටිය | තොරතුරු තාක්‍ෂණ ශිල්පී | NVQ L IV | මාස 06 | මාස 06 | 6,000 |
| 12 | මාලබේ වෘත්තීය පුහුණු | පරිගණක දෘඩාංග තාක්‍ෂණය | NVQ L IV | මාස 06 | මාස 06 | 6,000 |
| | මධ්‍යස්ථානය ශාලවනෝද්‍යාරාමය, | අධිවේගී මහන යන්ත්‍ර ක්‍රියාකරු | - | මාස 03 | මාස 03 | නොමිලේ |
| | තලාහේන, මාලබේ | පෑස්සුම් ශිල්පී | NVQ L III | මාස 06 | මාස 06 | නොමිලේ |

*පාඨමාලා හදාරන්නන් සඳහා ලැබෙන ප්‍රතිලාභ :*

* ජාත්‍යන්තරව පිළිගත් NVQ සහතිකය
* ආයතනික පුහුණුවෙන් පසු ඉහළ දීමනාවක් සමඟ වැඩිදුර පුහුණුව
* ස්වයං රැකියා සඳහා ව්‍යවසායකත්ව පුහුණුව සමඟ මූල්‍යාධාර පහසුකම්
* පුහුණුවෙන් පසු අනිවාර්ය දෙස් විදෙස් රැකියාගත කිරීම
* වෘත්තීය උපදේශක සේවාව සහ ඉංග්‍රීසි දැනුම
* ක්ෂේත්‍රයේ ශිල්පීය නිපුණතාවය වර්ධනය කිරීමේ වැඩමුළු
* ජාතික වෘත්තීය සුදුසුකම් සහතිකය (NVQ) මට්ටම 3 හා 4 ලබා ගැනීමෙන් පසු ඩිප්ලෝමා, උසස් ඩිප්ලෝමා හා තාක්ෂණ උපාධියක් ලබා ගැනීමේ අවස්ථාව
* ශිල්පීය ප්‍රවර්ධන දැනුම
* විශේෂ වූ පාඨමාලා කිහිපයක් සඳහා මාසික දීමනා
* ව්‍යාපාර උපදේශන සේවා
* වෘත්තීය උපදේශක සේවාව සහ ඉංග්‍රීසි දැනුම
* NVQ පාඨමාලා නිපුණතා පාදක පුහුණුව (CBT) යටතේ හැදෑරීම
* පෞරුෂ වර්ධන වැඩසටහන්

*පාඨමාලා සඳහා තෝරා ගැනීම* :

* සම්මුඛ පරීක්ෂණයකින් සිදු කරනු ලැබේ.
* පරිගණක ක්ෂේත්‍රයේ පාඨමාලා සඳහා ඉල්ලුම් කරන්නන් අ. පො. ස. (සා. පෙ.) ඉංග්‍රීසි විෂය සමත් විය යුතුය.
* වයස අවුරුදු 16 - 30 ත් අතර අයදුම්කරුවන් සඳහා ඉල්ලුම් කල හැකිය.

පාඨමාලා සඳහා අයදුම්පත් භාරගන්නා අවසන් දිනය 2012.07.05 දින වේ.

ඔබ විසින් සකස් කරන ලද අයදුම්පත් ඉහත දිනට පෙර පහත සඳහන් ලිපිනයට හෝ ඔබ ඉල්ලුම් කරන මධ්‍යස්ථානයේ මධ්‍යස්ථානාධිපති වෙත යොමු කරන්න.

සහකාර අධ්‍යක්ෂ,
ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය,
දිස්ත්‍රික් කාර්යාලය,
මහාමේඝ පෙදෙස, මහරගම.

වැඩි දුර විමසීම් සඳහා දුරකථන අංකය : 011-2844151.

"ජීවිතයට හැකියාවක් හැකියාවට රැකියාවක්"

සභාපති,
ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය.

06-331

---

**සෞඛ්‍ය අමාත්‍යාංශය**

වෛද්‍ය කර්මය සඳහා වූ පරිපූරක වෘත්තීන්ගේ සේවාවේ හා අතුරු වෛද්‍ය සේවාවේ පුහුණුව සඳහා අභ්‍යාසලාභීන් බඳවා ගැනීම - 2012 වර්ෂය

සෞඛ්‍ය අමාත්‍යාංශයේ වෛද්‍ය කර්මය සඳහා වූ පරිපූරක වෘත්තීන්ගේ සේවාවේ හා අතුරු වෛද්‍ය සේවාවේ පහත සඳහන් පාඨමාලාවන් සඳහා අභ්‍යාසලාභීන් බඳවා ගැනීමට සුදුසුකම් ලබා ඇති ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| *සංකේත අංකය* | *පුහුණු පාඨමාලාවේ නම* | *පුහුණු කාල සීමාව* | *පුහුණු පාඨමාලාව හැදෑරිය යුතු භාෂා මාධ්‍යය* |
|---|---|---|---|
| 1 | වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ | වසර 02 | ඉංග්‍රීසි |
| 2 | භෞත චිකිත්සක | වසර 02 | ඉංග්‍රීසි |
| 3 | වෘත්තීය චිකිත්සක | වසර 02 | ඉංග්‍රීසි |

| සංකේත අංකය | පුහුණු පාඨමාලාවේ නම | පුහුණු කාල සීමාව | පුහුණු පාඨමාලාව හැදෑරිය යුතු භාෂා මාධ්‍යය |
|---|---|---|---|
| 4 | විකිරණ ශිල්පී | වසර 02 | ඉංග්‍රීසි |
| 5 | මහජන සෞඛ්‍ය පරීක්ෂක | වසර 1 1/2 (ක්ෂේත්‍ර පුහුණුව මාස 06කි) | සිංහල, දෙමළ, ඉංග්‍රීසි |
| 6 | පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනී | වසර 1 1/2 (ක්ෂේත්‍ර පුහුණුව මාස 06කි) | සිංහල, දෙමළ, ඉංග්‍රීසි |
| 7 | බන්තු රේඛන ශිල්පී | වසර 01 | ඉංග්‍රීසි |
| 8 | විද්‍යුත් නිකර්පණ රේඛන සටහන්කරු | වසර 01 | ඉංග්‍රීසි |
| 9 | මහජන සෞඛ්‍ය රසායනාගාර ශිල්පී | වසර 01 1/4 | ඉංග්‍රීසි |
| 10 | ඖෂධවේදී | වසර 02 | ඉංග්‍රීසි |
| 11 | අක්ෂි තාක්ෂණවේදී | වසර 02 | ඉංග්‍රීසි |
| 12 | දන්ත කාර්මික | වසර 02 | ඉංග්‍රීසි |
| 13 | කීට විද්‍යා සහකාර | වසර 02 | ඉංග්‍රීසි |
| 14 | පාසල් දන්ත චිකිත්සක | වසර 02 | ඉංග්‍රීසි |

1. අ. පො. ස. (උ. පෙළ) විභාගයේ දී ලබා ගන්නා ලද Z අගය අනුව කුසලතා ලේඛන සකස් කර දීප ව්‍යාප්ත කුසලතාවය මත 30%ක් ද, පළාත් කුසලතාවය මත 70% ක් ද වන ලෙස සුදුස්සන් තෝරා ගනු ලැබේ. පුහුණු පාඨමාලාවන්ට එම පළාත්වලින් බඳවාගත හැකි අභ්‍යාසලාභීන් සංඛ්‍යාව එම පළාතේ පවතින රේඛීය අමාත්‍යාංශයට හා පළාත් සභාවට අයත් රෝහල් හා ආයතනවල පවතින පුරප්පාඩු ප්‍රමාණය පදනම් කර ගනිමින් තෝරාගනු ලැබේ.

   එක් පාඨමාලාවක් සඳහා අ. පො. ස. (උ. පෙළ) විභාගයේ Z අගය පදනම් කරගෙන වර්ෂ කිහිපයක උසස්පෙළ සමතුන්ගෙන් අයදුම්පත් කැඳවා ඇති අවස්ථාවක දී, පුහුණුව සඳහා අවශ්‍ය මුළු අභ්‍යාසලාභීන් සංඛ්‍යාව තෝරාගැනෙනුයේ සියලු වර්ෂවල සුදුසුකම්ලත් මුළු අයදුම්කරුවන්ගේ එකතුවෙන් ඒ ඒ වර්ෂවල සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගේ ප්‍රතිශතයක් වශයෙනි.

2. පාඨමාලාවන් දෙකක් හෝ ඊට වැඩියෙන් අයදුම් කරන්නන් මෙහි අවසානයේ දක්වා ඇති ආකෘතියට අනුව එක් මනාප ප්‍රකාශයක් සකස් කර ඒ ඒ පාඨමාලාවන් සඳහා තම මනාපය අංක එකේ සිට අනුපිළිවෙලින් සඳහන් කර යුතු ය. එසේ මනාපය අනුව පුහුණු පාඨමාලාව ලබා දිය නොහැකි අවස්ථාවල අයදුම්කරුවන් පළමුව තේරී පත් වන පාඨමාලාවට ඇතුළත් විය යුතු අතර, ඔවුන්ට ඊළඟ පාඨමාලාවට ඇතුළත්වීමට හෝ වෙනත් පාඨමාලාවකට මාරුවීමට හෝ අවස්ථාව ලබා දෙනු නොලැබේ.

3. මෙම පාඨමාලාවන් පූර්ණකාලීන පාඨමාලාවන් වේ. එබැවින් සතියේ දින පහේ සහ සෙනසුරාදා පෙරවරුවේ විශ්වවිද්‍යාලයක හෝ සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ හෝ වෙනත් රජයේ ආයතනයක හෝ වෙනත් කුමන හෝ පූර්ණකාලීන පාඨමාලාවන් හදාරන සිසුන් මේ සඳහා අයදුම් නොකළ යුතුය. යමෙකු එසේ අයදුම් කර පසු අවස්ථාවක දී හෝ එය අනාවරණය වුවහොත් පාඨමාලාවෙන්/තනතුරෙන් ඉවත් කර ඒ වනතෙක් රජය විසින් ඔහු/ඇය වෙනුවෙන් දරා ඇති සියලුම වියදම් අයකර ගනු ලැබේ. විශ්වවිද්‍යාලයක පූර්ණකාලීන පාඨමාලාවක් හදාරන අයෙකු එසේ අයදුම් කිරීමට අදහස් කරන්නේ නම් ඒ සඳහා පහත දැක්වෙන ආකාරයට ක්‍රියා කළ යුතුය. සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ පූර්ණකාලීන පුහුණු පාඨමාලාවල ලියාපදිංචි වී සිටින අයගේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

   3.1 කිසියම් දිනක ඔබ කුමන හෝ විශ්වවිද්‍යාලයක හෝ වෙනත් රජයේ ආයතනයක පූර්ණකාලීන පාඨමාලාවක් සඳහා ලියාපදිංචිව සිටියේ නම් හෝ සිටින්නේ නම් 2012.07.09 දින වන විට ඔබ එම ලියාපදිංචිය අවලංගු කරගෙන තිබිය යුතුය. ඔබ විශ්වවිද්‍යාලයක ලියාපදිංචිව සිට දේශන සඳහා සහභාගි නොවූ හෝ සහභාගි නොවන අයෙක් වුව ද ඔබ විශ්වවිද්‍යාල සිසුවෙකු ලෙස සලකනු ලබන බැවින් එවැනි අයදුම්කරුවන් ද තම ලියාපදිංචිය අවලංගු කරගත යුතුය. අවශ්‍ය අවස්ථාවල දී එය සනාථ කිරීම පිණිස ප්‍රමාණවත් ලිඛිත සාධක ඔබ සතුව තිබිය යුතුය.

   3.2 ඉහත 2012.07.09 දින වන විට ඔබ විශ්වවිද්‍යාලයක හෝ සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ පැවැත්වෙන පාඨමාලාවක හෝ ලියාපදිංචි වී නොසිටි අයෙක් වුව ද යම් හෙයකින් අදාළ පාඨමාලාවට අභ්‍යාසලාභීන් බඳවා ගැනීමේ සම්මුඛ පරීක්ෂණ පැවැත්වෙන දින වනවිට ලියාපදිංචිව සිටියේ නම් ඔහු/ඇය ද මෙම පාඨමාලාවට නුසුදුස්සකු වනු ඇත.

   3.3 ඔබ යම් විශ්වවිද්‍යාලයක උපාධියක් සම්පූර්ණ කර සිටින අයෙක් නම් එම උපාධිය බලපැවැත්වෙන දිනය (Effective Date) අයදුම්පත් භාරගන්නා දින හෝ ඊට පෙර දිනයක් විය යුතුය.

*සැලකිය යුතුය :-*

* ඉහත 3.1 සිට 3.3 දක්වා සඳහන් කොන්දේසි සියල්ල සම්පූර්ණ කර තිබේනම් අනිවාර්යයෙන්ම ඔබ අයදුම් කරන පාඨමාලාව සඳහා ඇතුළත් කර ගන්නේ ය යන්න මෙම ගැසට් නිවේදනයේ කුමන හෝ වගන්තියක් මඟින් අදහස් නොකෙරෙන බව ඔබ තරයේ සිහි තබාගත යුතුය.

* එම 3.1 සිට 3.3 දක්වා සඳහන් කොන්දේසි සම්පූර්ණ කර තිබුණ ද ඔබ සුදුසුකම් ලැබීමට ප්‍රමාණවත් Z අගයක් ලබා නොමැති නම් හෝ මෙහි සඳහන් අනෙකුත් කුමන හෝ කොන්දේසියක් සම්පූර්ණ කර නොමැති නම් කිසිදු අයුරකින් මෙම පාඨමාලාවන් සඳහා සුදුසුකම් නොලබන බව ඔබ දැනගත යුතුය.

* එමෙන්ම ඔබ ප්‍රමාණවත් Z අගයක් ලබා මෙහි සඳහන් අනෙකුත් කොන්දේසි සියල්ල සම්පූර්ණ කර තිබුණ ද 3.1 සිට 3.3 දක්වා සඳහන් කොන්දේසි සම්පූර්ණ කර නොමැති නම් කිසිදු අයුරකින් මෙම පාඨමාලාවන් සඳහා සුදුසුකම් නොලබන බව ඔබ තවදුරටත් දැනගත යුතුය.

4. *අධ්‍යාපන හා තනතුරට අදාළ වෙනත් විශේෂ සුදුසුකම් :-*

| *සංකේත අංකය* | *පුහුණු පාඨමාලාව* | *අ. පො. ස. (සා. පෙළ) සුදුසුකම්* | *අ. පො. ස. (උ. පෙළ) සුදුසුකම්* | *පුහුණු පාඨමාලාවට අදාළ වෙනත් විශේෂ සුදුසුකම්* |
|---|---|---|---|---|
| 1 | වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ | සිංහල භාෂාව/දෙමළ භාෂාව, ගණිතය, විද්‍යාව සහ තවත් එක් විෂයයකට අවම වශයෙන් සම්මාන සාමාර්ථ සහිතව දෙවරකට නොවැඩි වාර ගණනක දී ඉංග්‍රීසි භාෂාව ඇතුළුව විෂයයන් හයකින් අ. පො. ස. (සා. පෙළ) සමත්වීම | 2007, 2008, 2009 හෝ 2010 යන වර්ෂවලින් එකක දී අ. පො. ස. (උ. පෙළ) විභාගයෙන් **රසායන විද්‍යාව** විෂයයට සම්මාන සාමාර්ථ සහිතව භෞතික විද්‍යාව, ජීව විද්‍යාව, කෘෂි විද්‍යාව, සංයුක්ත ගණිතය යන විෂයයන් අතුරින් දෙකක් එක්වරක දී සමත්වීම | නැත |
| 2 | භෞත චිකිත්සක | සිංහල භාෂාව/දෙමළ භාෂාව, ගණිතය, විද්‍යාව සහ තවත් එක් විෂයයකට අවම වශයෙන් සම්මාන සාමාර්ථ සහිතව දෙවරකට නොවැඩි වාර ගණනක දී ඉංග්‍රීසි භාෂාව ඇතුළුව විෂයයන් හයකින් අ. පො. ස. (සා. පෙළ) සමත්වීම | 2007, 2008, 2009 හෝ 2010 යන වර්ෂවලින් එකක දී අ. පො. ස. (උ. පෙළ) විභාගයෙන් **භෞතික විද්‍යාව** විෂයයට සම්මාන සාමාර්ථ සහිතව රසායන විද්‍යාව, ජීව විද්‍යාව, කෘෂි විද්‍යාව, සංයුක්ත ගණිතය යන විෂයයන් අතුරින් දෙකක් එක්වරක දී සමත්වීම | නැත |
| 3 | වෘත්තීය චිකිත්සක | සිංහල භාෂාව/දෙමළ භාෂාව, ගණිතය, විද්‍යාව සහ තවත් එක් විෂයයකට අවම වශයෙන් සම්මාන සාමාර්ථ සහිතව දෙවරකට නොවැඩි වාර ගණනක දී ඉංග්‍රීසි භාෂාව ඇතුළුව විෂයයන් හයකින් අ. පො. ස. (සා. පෙළ) සමත්වීම | 2007, 2008, 2009 හෝ 2010 යන වර්ෂවලින් එකක දී අ. පො. ස. (උ. පෙළ) විභාගයෙන් **භෞතික විද්‍යාව** විෂයයට සම්මාන සාමාර්ථ සහිතව රසායන විද්‍යාව, ජීව විද්‍යාව, කෘෂි විද්‍යාව, සංයුක්ත ගණිතය යන විෂයයන් අතුරින් දෙකක් එක් වරක දී සමත්වීම | නැත |
| 4 | විකිරණ ශිල්පී | සිංහල භාෂාව/දෙමළ භාෂාව, ගණිතය, විද්‍යාව සහ තවත් එක් විෂයයකට අවම වශයෙන් සම්මාන සාමාර්ථ සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී ඉංග්‍රීසි භාෂාව ඇතුළුව විෂයයන් හයකින් අ. පො. ස. (සා. පෙළ) සමත්වීම | 2007, 2008, 2009 හෝ 2010 යන වර්ෂ වලින් එකකදී අ. පො. ස. (උ. පෙළ) විභාගයෙන් එක් වරකදී **භෞතික විද්‍යාව** විෂයයට සම්මාන සාමාර්ථ සහිතව රසායන විද්‍යාව, ජීව විද්‍යාව, කෘෂි විද්‍යාව, සංයුක්ත ගණිතය යන විෂයයන් අතුරින් දෙකක් එක් වරක දී සමත්වීම | නැත |
| 5 | මහජන සෞඛ්‍ය පරීක්ෂක | සිංහල භාෂාව/දෙමළ භාෂාව, ගණිතය, විද්‍යාව සහ තවත් එක් විෂයයකට අවම වශයෙන් සම්මාන සාමාර්ථ සහිතව දෙවරකට නොවැඩි වාර ගණනක දී ඉංග්‍රීසි භාෂාව ඇතුළුව විෂයයන් හයකින් අ. පො. ස. (සා. පෙළ) සමත්වීම | 2008, 2009 හෝ 2010 යන වර්ෂ වලින් එකක දී අ. පො. ස. (උ. පෙළ) විභාගයෙන් **ජීව විද්‍යාව හෝ සංයුක්ත ගණිතය** විෂයයට සම්මාන සාමාර්ථයක් සහිතව භෞතික විද්‍යාව, රසායන විද්‍යාව, කෘෂි විද්‍යාව යන විෂයයන් අතුරින් දෙකක් එක්වරක දී සමත්වීම | * අයදුම් කළ හැක්කේ පුරුෂ පක්ෂයට පමණි<br>* උස අඩි 5 අඟල් 2ක් හෝ ඊට වැඩි විය යුතුය. |
| 6 | පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනී | සිංහල භාෂාව/දෙමළ භාෂාව, ගණිතය, විද්‍යාව සහ තවත් එක් විෂයයකට අවම වශයෙන් සම්මාන සාමාර්ථ සහිතව දෙවරකට නොවැඩි වාර ගණනක දී ඉංග්‍රීසි භාෂාව ඇතුළුව විෂයයන් හයකින් අ. පො. ස. (සා. පෙළ) සමත්වීම. | 2008, 2009 හෝ 2010 යන වර්ෂ වලින් එකක දී අ. පො. ස. (උ. පෙළ) විභාගයෙන් ජීව විද්‍යාව, භෞතික විද්‍යාව, රසායන විද්‍යාව හා කෘෂි විද්‍යාව යන විෂයයන් අතුරින් තුනක් එක්වරක දී සමත්වීම. | * අයදුම් කළ හැක්කේ ස්ත්‍රී පක්ෂයට පමණි.<br>* උස අඩි 4 අඟල් 10ක් හෝ ඊට වැඩි විය යුතුය. |

| සංකේත අංකය | පුහුණු පාඨමාලාව | අ. පො. ස. (සා. පෙළ) සුදුසුකම් | අ. පො. ස. (උ. පෙළ) සුදුසුකම් | පුහුණු පාඨමාලාවට අදාළ වෙනත් විශේෂ සුදුසුකම් |
|---|---|---|---|---|
| | | | | * සියලුම අයදුම්කාරියන් අවිවාහක විය යුතු අතර පුහුණු කාල සීමාව තුළ විවාහ නොවිය යුතුය. න්‍යායික පුහුණුව ලබා දී තාවකාලිකව සේවයේ යොදවන සිසුවියන් ද විධිමත් පුහුණුව සඳහා අනුයුක්තකර පත්වීම් ලබා දෙන තෙක් විවාහයට ඇතුළත් නොවිය යුතුය. |
| 7 | බන්තු රේඛන ශිල්පී | සිංහල භාෂාව/දෙමළ භාෂාව, ගණිතය, විද්‍යාව සහ තවත් එක් විෂයයකට අවම වශයෙන් සම්මාන සාමාර්ථ සහිතව දෙවරකට නොවැඩි වාර ගණනක දී ඉංග්‍රීසි භාෂාව ඇතුළුව විෂයයන් හයකින් අ. පො. ස. (සා. පෙළ) සමත්වීම | 2008, 2009 හා 2010 යන වර්ෂවලින් එකක දී අ. පො. ස. (උ. පෙළ) විභාගයෙන් ජීව විද්‍යාව විෂයයට සම්මාන සාමාර්ථ සහිතව රසායන විද්‍යාව, භෞතික විද්‍යාව, කෘෂි විද්‍යාව යන විෂයයන් අතුරින් දෙකක් එක්වරක දී සමත්වීම | නැත |
| 8 | විද්‍යුත් නිකර්පන රේඛන සටහන්කරු | සිංහල භාෂාව/දෙමළ භාෂාව, ගණිතය, විද්‍යාව සහ තවත් එක් විෂයයකට අවම වශයෙන් සම්මාන සාමාර්ථ සහිතව දෙවරකට නොවැඩි වාර ගණනක දී ඉංග්‍රීසි භාෂාව ඇතුළුව විෂයයන් හයකින් අ. පො. ස. (සා. පෙළ) සමත්වීම. | 2008, 2009 හා 2010 යන වර්ෂවලින් එකක දී අ. පො. ස. (උ. පෙළ) විභාගයෙන් ජීව විද්‍යාව විෂයයට සම්මාන සාමාර්ථ සහිතව රසායන විද්‍යාව, භෞතික විද්‍යාව, කෘෂි විද්‍යාව යන විෂයයන් අතුරින් දෙකක් එක්වරක දී සමත්වීම | නැත |
| 9 | මහජන සෞඛ්‍ය රසායනාගාර ශිල්පී | සිංහල භාෂාව/දෙමළ භාෂාව, ගණිතය, විද්‍යාව සහ තවත් එක් විෂයයකට අවම වශයෙන් සම්මාන සාමාර්ථ සහිතව දෙවරකට නොවැඩි වාර ගණනක දී ඉංග්‍රීසි භාෂාව ඇතුළුව විෂයයන් හයකින් අ. පො. ස. (සා. පෙළ) සමත්වීම. | 2008, 2009 හා 2010 යන වර්ෂ වලින් එකක දී අ. පො. ස. (උ. පෙළ) විභාගයෙන් ජීව විද්‍යාව විෂයයට සම්මාන සාමාර්ථ සහිතව රසායන විද්‍යාව, භෞතික විද්‍යාව, කෘෂි විද්‍යාව යන විෂයයන් අතුරින් දෙකක් එක්වරක දී සමත්වීම | නැත |
| 10 | ඖෂධවේදී | සිංහල භාෂාව/දෙමළ භාෂාව, ගණිතය, විද්‍යාව සහ තවත් එක් විෂයයකට අවම වශයෙන් සම්මාන සාමාර්ථ සහිතව දෙවරකට නොවැඩි වාර ගණනක දී ඉංග්‍රීසි භාෂාව ඇතුළුව විෂයයන් හයකින් අ. පො. ස. (සා. පෙළ) සමත්වීම. | 2009 හෝ 2010 යන වර්ෂවලින් එකක දී අ. පො. ස. (උ. පෙළ) විභාගයෙන් **රසායන විද්‍යාව** විෂයයට සම්මාන සාමාර්ථ සහිතව භෞතික විද්‍යාව, ජීව විද්‍යාව, කෘෂි විද්‍යාව, සංයුක්ත ගණිතය යන විෂයයන් අතුරින් දෙකක් එක්වරක දී සමත්වීම | නැත |
| 11 | අක්ෂි තාක්ෂණවේදී | සිංහල භාෂාව/දෙමළ භාෂාව, ගණිතය, විද්‍යාව සහ ඉංග්‍රීසි විෂයයට අවම වශයෙන් සම්මාන සාමාර්ථ සහිතව දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් අ. පො. ස. (සා. පෙළ) සමත්වීම | 2010 වර්ෂයේ දී අ. පො. ස. (උ. පෙළ) විභාගයෙන් **භෞතික විද්‍යාව** විෂයයට සම්මාන සාමාර්ථ සහිතව රසායන විද්‍යාව, ජීව විද්‍යාව, කෘෂි විද්‍යාව යන විෂයයන් අතුරින් දෙකක් එක්වරක දී සමත්වීම | නැත |

| සංකේත අංකය | පුහුණු පාඨමාලාව | අ. පො. ස. (සා. පෙළ) සුදුසුකම් | අ. පො. ස. (උ. පෙළ) සුදුසුකම් | පුහුණු පාඨමාලාවට අදාළ වෙනත් විශේෂ සුදුසුකම් |
|---|---|---|---|---|
| 12 | දන්ත කාර්මික | සිංහල භාෂාව/දෙමළ භාෂාව, ගණිතය, විද්‍යාව සහ තවත් එක් විෂයයකට අවම වශයෙන් සම්මාන සාමාර්ථ සහිතව දෙවරකට නොවැඩි වාර ගණනක දී ඉංග්‍රීසි භාෂාව ඇතුළුව විෂයයන් හයකින් අ. පො. ස. (සා. පෙළ) සමත්වීම | 2010 වර්ෂයේ දී අ. පො. ස. (උ. පෙළ) විභාගයෙන් රසායන විද්‍යාව විෂයයට සම්මාන සාමාර්ථ සහිතව භෞතික විද්‍යාව, ජීව විද්‍යාව, කෘෂි විද්‍යාව, සංයුක්ත ගණිතය යන විෂයයන් අතුරින් දෙකක් එක්වරක දී සමත්වීම | නැත |
| 13 | කීට විද්‍යා සහකාර | සිංහල භාෂාව/දෙමළ භාෂාව, ගණිතය, විද්‍යාව සහ තවත් එක් විෂයයකට අවම වශයෙන් සම්මාන සාමාර්ථ සහිතව දෙවරකට නොවැඩි වාර ගණනක දී ඉංග්‍රීසි භාෂාව ඇතුළුව විෂයයන් හයකින් අ. පො. ස. (සා. පෙළ) සමත්වීම | 2010 වර්ෂයේ දී අ. පො. ස. (උ. පෙළ) විභාගයෙන් ජීව විද්‍යාව විෂයයට සම්මාන සාමාර්ථ සහිතව රසායන විද්‍යාව, භෞතික විද්‍යාව, කෘෂි විද්‍යාව යන විෂයයන් අතුරින් දෙකක් එක්වරක දී සමත්වීම. | * අයදුම් කළ හැක්කේ පුරුෂ පක්ෂයට පමණි. |
| 14 | පාසල් දන්ත චිකිත්සක | සිංහල භාෂාව/දෙමළ භාෂාව, ගණිතය, විද්‍යාව සහ තවත් එක් විෂයයකට අවම වශයෙන් සම්මාන සාමාර්ථ සහිතව දෙවරකට නොවැඩි වාර ගණනක දී ඉංග්‍රීසි භාෂාව ඇතුළුව විෂයයන් හයකින් අ. පො. ස. (සා. පෙළ) සමත්වීම. | 2010 වර්ෂයේ දී අ. පො. ස. (උ. පෙළ) විභාගයෙන් ජීව විද්‍යාව විෂයයට සම්මාන සාමාර්ථ සහිතව රසායන විද්‍යාව, භෞතික විද්‍යාව, කෘෂි විද්‍යාව යන විෂයයන් අතුරින් දෙකක් එක්වරක දී සමත්වීම. | * අයදුම් කළ හැක්කේ ස්ත්‍රී පක්ෂයට පමණි. * උස අඩි 4 අඟල් 10ක් හෝ ඊට වැඩි විය යුතු ය. * සියලුම අයදුම්කාරියන් අවිවාහක විය යුතුය. |

5. *අනෙකුත් පොදු සුදුසුකම් :-*

(අ) 2012.07.09 දිනට වයස අවුරුදු 18ට නොඅඩු, වයස අවුරුදු 30ට නොවැඩි විය යුතුය.
(ආ) පුහුණුවෙන් පසු බඳවා ගන්නා පළාත තුළ අවම වශයෙන් වසර 10ක් වත් සේවය කිරීමට කැමැති විය යුතුය.
(ඇ) මනා ශාරීරික හා මානසික සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත විය යුතුය.
(ඈ) තමන් අයදුම් කරන දිස්ත්‍රික්කය තුළ අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පූර්වාසන්න වසර 3ක් අඛණ්ඩව පදිංචිව සිටිය යුතුය.

6. *අයදුම් කළ යුතු ක්‍රමය :*

(අ) මේ සමග ඇති ආකෘති පත්‍රය අනුව අයදුම්පත සකස් කර ගත යුතු ය. ඒ සඳහා ඒ4 ප්‍රමාණයේ කඩදාසි භාවිතා කළ යුතුය. අයදුම්පතේ 1 සිට 10(අ) දක්වා පළමු පිටුවේ ද, 10(ආ) සිට 12 දක්වා දෙවන පිටුවේ ද වන පරිදි සකස් කළ යුතුය. පුහුණු පාඨමාලා දෙකක් හෝ කිහිපයක් සඳහා අයදුම් කරන්නේ නම් වෙන වෙනම අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය. එවැනි අවස්ථාවක දී අංක 2 වගන්තියේ සඳහන් පරිදි සකස් කරන ලද එක් මනාප ප්‍රකාශයක් සමග අයදුම්පත් සියල්ලම එක් කවරයක බහා මෙහි (ඈ) හි සඳහන් පරිදි යොමු කළ යුතුය.

(ආ) එක් අයදුම්පතක් සඳහා අයදුම්පතේ 'මුද්දර' යන ස්ථානයේ රු. 300 ක මුද්දර නොගැලවෙන සේ අලවා තම අත්සන ඒ මත යොදා එය අවලංගු කළ යුතු ය. පාඨමාලාවන් දෙකක් හෝ කිහිපයක් සඳහා අයදුම්කරන්නේ නම් ඒ සෑම අයදුම්පතකම මුද්දර ඇලවීම අනිවාර්යය වේ.

(ඇ) ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරියෙකු/අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරියෙකු/රජයේ ගණකාධිකාරී සේවයේ නිලධාරියෙකු/රජයේ විදුහල්පතිවරයෙකු/සාමදාන විනිශ්චයකාරවරයෙකු/නීතිඥවරයෙකු හෝ වර්ෂයකට රු. 2,40,360කට නොඅඩු වැටුපක් ලබන ස්ථිර විශ්‍රාම වැටුප් සහිත තනතුරක් දරන රජයේ නිලධාරියෙකු විසින් අයදුම්කරුගේ/අයදුම්කාරියගේ අත්සන සහතික කළ යුතුය.

(ඈ) නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් සමග ඊට ඉහළින් එක් මනාප ප්‍රකාශයක් අමුණා සියලුම අයදුම්පත් එක් කවරයකට බහා එම කවරයේ ඉහළ වම් කෙළවරේ "පරිපූරක හා අතුරු වෛද්‍ය සේවාවන්හි පුහුණුව සඳහා අභ්‍යාසලාභීන් බඳවා ගැනීම - 2012" වශයෙන් සඳහන් කොට 2012.07.09 දිනට පෙර ඔබ ස්ථිර පදිංචි පළාතේ 'පළාත් සෞඛ්‍ය ලේකම්' වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. එක් එක් පළාත් සභාවන්ට අයත් සෞඛ්‍ය ලේකම්වරුන්ගේ ලිපිනයන් පහතින් දක්වා ඇත. :-

1. සෞඛ්‍ය ලේකම්, බස්නාහිර පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශය, නිදහස් චතුරස්‍රය, කොළඹ 07
2. සෞඛ්‍ය ලේකම්, මධ්‍යම පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශය, තැ. පෙ. 121, සංඝරාජ මාවත, මහනුවර
3. සෞඛ්‍ය ලේකම්, ඌව පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශය, අංක 301, ආර්. එච්. ගුණවර්ධන මාවත, බදුල්ල

4. සෞඛ්‍ය ලේකම්, වයඹ පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශය, 3 වැනි මහල, පළාත් සභා සංකීර්ණය, කුරුණෑගල
5. සෞඛ්‍ය ලේකම්, උතුරු මැද පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශය, ධර්මපාල මාවත, අනුරාධපුරය
6. සෞඛ්‍ය ලේකම්, දකුණු පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශය, පහළ ඩික්සන් පාර, ගාල්ල
7. සෞඛ්‍ය ලේකම්, සබරගමුව පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශය, නව නගරය, රත්නපුරය
8. සෞඛ්‍ය ලේකම්, නැගෙනහිර පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශය, ඇතුල් වරාය පාර, ත්‍රිකුණාමලය
9. සෞඛ්‍ය ලේකම්, උතුරු පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශය, සෞඛ්‍ය ගම්මානය, පන්නයි, යාපනය.

7. රජයේ හෝ අර්ධ රාජ්‍ය ආයතනවල සේවකයින්ගේ අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානියා මඟින් එවිය යුතුය. එමෙන්ම මෙය බාහිර බඳවා ගැනීමක් බව සිහි තබාගත යුතු ය.

8. අයදුම්පත් ලැබුණු බව දන්වා එවනු නොලැබේ.

9. නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

10. මෙම නිවේදනයේ දැක්වෙන නියමයන්ට හා අදාළ ආකෘතියට අනුකූල නොවන අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

11. ඉහත සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන්/අයදුම්කාරියන් අතරින් Z අගය අනුව සකස් කරනු ලබන ප්‍රමුඛතා ලේඛනයක් පදනම් කරගෙන තෝරාගත් පිරිසක් පමණක් සෞඛ්‍ය අමාත්‍යාංශයේ හා පළාත් සභාවන්හි මාණ්ඩලික නිලධාරීන්ගේ නියෝජනයෙන් යුතු සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයේ දී අයදුම්කරුවන්/අයදුම්කාරියන් විසින් පහත සඳහන් ලියවිලිවල මුල් පිටපත් ඉදිරිපත් කළ යුතුය. :-
   (අ) උප්පැන්න සහතිකය,
   (ආ) අ. පො. ස. (උ. පෙළ) විභාග ප්‍රතිඵල හා Z අගය දැක්වෙන සහතිකයේ මුල් පිටපත (මෙහි සහතික කළ පිටපතක් අයදුම්පත සමඟ ද අමුණා එවිය යුතු ය.),
   (ඇ) අ. පො. ස. (සා. පෙළ) විභාග ප්‍රතිඵල දැක්වෙන සහතිකයේ මුල් පිටපත,
   (ඈ) ජාතික හැඳුනුම්පත හෝ විදේශ ගමන් බලපත්‍රය හෝ රියැදුරු බලපත්‍රය (මෙහි සහතික කළ පිටපතක් අයදුම්පත සමඟ ද අමුණා එවිය යුතුය.),
   (ඉ) ඉහත 5 (ඈ) අනුව පදිංචිය සනාථ කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම් විසින් අනු අත්සන් කරන ලද ග්‍රාම නිලධාරී විසින් නිකුත් කරන ලද පදිංචිය පිළිබඳ සහතිකය ( ග්‍රාම නිලධාරී සහතිකය),
   (ඊ) අවිවාහක බව සනාථ කිරීම සඳහා සාමදාන විනිශ්චයකරුවෙකු ඉදිරියේ අත්සන් කරන ලද විධිමත් දිවුරුම් ප්‍රකාශයක් (මෙය පවුල් සෞඛ්‍ය සේවිකා පුහුණුවට හා පාසල් දන්ත චිකිත්සක පුහුණුවට අයදුම් කරන අයදුම්කාරියන්ට පමණක් අදාළ වේ.)

12. *පුහුණු කිරීමේ පටිපාටිය* :

(i) සම්මුඛ පරීක්ෂණයට ලක් කරන ලද අයදුම්කරුවන් අතරින් තෝරාගත් අයදුම්කරුවන්/අයදුම්කාරියන් අදාළ පුහුණු පාඨමාලාව හැදෑරීම සඳහා ඒ ඒ පුහුණු පාසල්වලට ඇතුළත් කරනු ලැබේ. පාඨමාලාවන් ඉංග්‍රීසි/සිංහල/දෙමළ මාධ්‍යයෙන් හැදෑරිය යුතු ය.

(ii) පුහුණු පාසල්වලට ඇතුළත් කරන අභ්‍යාසලාභීන් පුහුණු පාසල්වල බල පැවැත්වෙන නීති රීතිවලට හා සෞඛ්‍ය අමාත්‍යාංශය මඟින් කලින් කලට පනවනු ලබන වෙනත් නියෝගවලට ද යටත් වනු ඇත.

(iii) පුහුණුව ලබන කාල පරිච්ඡේදය තුළ නියමිත විභාගවලින් අසමත් වන හෝ වැඩ හා හැසිරීම සතුටුදායක නොවන හෝ තමන් ඇතුලත් කරනු ලබන පුහුණු පාසලෙහි විභාග හා නිවාඩුවලට අදාළ කොන්දේසි පිළිපැදීමට අපොහොසත් වන අභ්‍යාසලාභීන්ගේ පුහුණුව ඕනෑම අවස්ථාවක දී වන්දි ගෙවීමකින් තොරව අවසන් කළ හැකිය.

(iv) පුහුණුව ලබන කාල පරිච්ඡේදය තුළ දී අභ්‍යාසලාභීන්ට රු. 12,360 ක මාසික දීමනාවක් ගෙවනු ලැබේ.

(v) පුහුණු පාසලට ඇතුළත් කරනු ලබන අවස්ථාවේ දී පුහුණුව සාර්ථකව නිම කරන බවටත්, පුහුණු පාඨමාලාව අත්හැර නොයන බවටත්, එකී පුහුණුව සම්පූර්ණයෙන්ම නිම කිරීමෙන් පසු අදාළ තනතුරේ පත්වීම් ලදහොත් අවම වශයෙන් වර්ෂ දහයක (10) කාලපරිච්ඡේදයක් අදාළ පළාත් සභාවේ හෝ රේඛීය අමාත්‍යාංශයේ පත්කළ රෝහලේ හෝ සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ හෝ අදාළ තනතුරේ සේවය කරන බවටත්, සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් සමඟ ගිවිසුමකට හා ඇපකරයකට එළඹිය යුතු ය. පුහුණු කාලසීමාව තුළදී පුහුණුවෙන් ඉවත් වුවහොත්, පුහුණුව හැරගියහොත්, ඉහත iii වගන්තිය අනුව පුහුණුවෙන් ඉවත් කිරීමට සිදුවුවහොත් හෝ පත්වීම් ලැබ වර්ෂ දහයක (10) කාලපරිච්ඡේදයක් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ අදාළ තනතුරේ සේවය කිරීමට අපොහොසත් වුවහොත් පුහුණු කාලය තුළදී ඔහුට/ඇයට ගෙවන ලද දීමනාව, රජය විසින් දරන ලද වියහියදම් හා ඇපකරයට අදාළ මුදල ඔහු/ඇය විසින් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු ය. එසේ නොමැති වුවහොත් එම මුදල් අයකර ගැනීමට ගිවිසුම් ප්‍රකාරව නීත්‍යානුකූලව කටයුතු කිරීමට පියවර ගනු ඇත.

13. *සේවයේ නියුක්ත කරවීමේ නියමයන්* :

පුහුණුව අවසානයේ ස්ථිර පත්වීම් ප්‍රදානය කිරීමට රජය බැඳී නොසිටී. එහෙත් අපේක්ෂක/අපේක්ෂිකාවන් තමන් පුහුණුවට බඳවාගත් පාඨමාලාවට අදාළ බඳවා ගැනීමේ පරිපාටියේ කොන්දේසි හා පළාතේ පවත්නා පුරප්පාඩු මත අදාල තනතුරේ III වැනි පංතියේ තනතුරට පත්කිරීම සඳහා සලකා බලනු ලැබේ. මුල් පත්වීමේ සිට වසර දහයක් යනතෙක් මුල් පත්වීම් ලබන ස්ථානයේ සේවය කිරීම අනිවාර්යය වේ.

එක් එක් පාඨමාලාවන් අවසානයේ දී පැවැත්වෙන අවසන් ලිඛිත පරීක්‍ෂණයේ ප්‍රතිඵල මත සකස් කරනු ලබන කුසලතා ලේඛනය පදනම් කරගෙන සහ ඉහත පළාත් මට්ටමෙන් බඳවාගනු ලැබූ 70% ක ප්‍රතිශතය හා දීප ව්‍යාප්ත කුසලතාවය මත බඳවාගනු ලැබූ 30%ක ප්‍රතිශතය ද සැලකිල්ලට ගෙන පුරප්පාඩු පවතින ආයතන වෙත පත්වීම් ලබාදීමට සලකා බැලීම සිදුකෙරේ.

14. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් පිළිබඳ විස්තර අයදුම්පත පිරවීමේ දී ඉතා සැලකිලිමත්ව හා නිවැරදිව ඇතුළත් කළ යුතුය. පුහුණුව සඳහා බඳවා ගැනීමෙන් හෝ පත්වීම් ලැබීමෙන් පසු යට කී සහතික ව්‍යාජ බවට ඔප්පු වුවහොත්, නීත්‍යානුකූලව කටයුතු කිරීම සඳහා අපරාධ පරීක්‍ෂණ දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීමටත්, ඒ දෙනු ලබන පත්වීම් අවලංගු කර පුහුණුවෙන්/තනතුරින් පහකරන අතර ඒ සම්බන්ධයෙන් විනයානුකූලව කටයුතු කර නැවත රජයේ සේවයට නොගන්නවුන්ගේ අසාධු ලේඛනයට ඔහුගේ/ඇයගේ නම ඇතුළත් කිරීමටත් කටයුතු කරනු ලැබේ. තව ද පුහුණු කාලය තුළ දී ඔහුට/ඇයට ගෙවන ලද දීමනාව, රජය විසින් දරන ලද වියහියදම් හා ඇපකරයට අදාළ මුදල ඔහුගෙන්/ඇයගෙන් අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ.

15. තෝරාගත් අයදුම්කරුවන් අදාළ පාඨමාලාව හැදෑරීමට හා දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට කායික හා මානසික යෝග්‍යතාවයකින් හෙබි බව සනාථ කරනු පිණිස පුහුණුවේ පළමු මාසය ඇතුළත වෛද්‍ය පරීක්‍ෂණයකට පෙනී සිටිය යුතු අතර, වෛද්‍ය පරීක්‍ෂණයේ දී අයෝග්‍ය බව පෙනී යන අයදුම්කරුවන් පාඨමාලාවේ රැඳී සිටීමට නුසුදුස්සන් වනු ඇත.

16. ඉහත පරිදි බඳවාගන්නා ලද සියලුම දෙනා රජයේ සේවකයින්ට අදාළ වන සියලුම නීතිරීති, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ විධිවිධානයන්ට, සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව විසින් නියම කරනු ලබන ප්‍රතිපත්තිවලට, මුදල් රෙගුලාසි හා වෙනත් රෙගුලාසිවලට ද, රජය වරින් වර පනවනු ලබන නීතිරීති හා නියෝගයන්ට ද යටත් වනු ඇත.

17. පුහුණුවට බඳවා ගැනීම සම්බන්ධයෙන් මෙම ගැසට් නිවේදනය මඟින් ආවරණය වන හෝ නොවන යම් කරුණක් සම්බන්ධයෙන් යම් ගැටළු සහගත තත්ත්වයක් උදා වුවහොත්, ඒ පිළිබඳව සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම්ගේ තීරණය අවසන් තීරණය වනු ඇත. මෙම ගැසට් නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි පාඨ අතර යම් පරස්පරතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු වන්නේ ය.

18. පුහුණුවට බඳවාගනු ලබන අයදුම්කරුවන් සඳහා පුහුණු පාසල්වල නේවාසික පහසුකම් සැපයීමට මෙම අමාත්‍යාංශය බැඳී නොසිටී. එසේ ලබාදෙන්නේ නම්, ඒ සඳහා තක්සේරු නිවාස කාමර කුලිය, ජල හා විදුලි බිල්පත් අයකරනු ලැබේ.

19. මෙම පුහුණු කාලසීමාව තුළ දී වෘත්තීය සමිති කටයුතුවල යෙදීම හෝ පෞද්ගලික සේවයේ යෙදීමට හෝ කිසිම අයිතිවාසිකමක් නොමැත. එසේම පුහුණුවෙන් පසුව ඔබ අදාළ තනතුරේ පත්වීම් ලදහොත් ඉන් පසුව ද පෞද්ගලික සේවයේ යෙදීමට ඔබට කිසිදු අයිතිවාසිකමක් නොමැත. එවැන්නක් සිදුකර අනාවරණය වුවහොත් නීත්‍යානුකූලව කටයුතු කිරීමට පියවර ගනු ලැබේ.

වෛද්‍ය රවීන්ද්‍ර රුබේරු,
ලේකම්,
සෞඛ්‍ය අමාත්‍යාංශය.

2012 මැයි මස 14 වැනි දින,
සෞඛ්‍ය අමාත්‍යාංශය,
"සුවසිරිපාය",
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

**පුහුණු පාඨමාලාවන් සඳහා මනාප ප්‍රකාශය**

| සංකේත අංකය | පුහුණු පාඨමාලාවේ නම | මනාපය |
|---|---|---|
| 1 | වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ | |
| 2 | භෞත චිකිත්සක | |
| 3 | වෘත්තීය චිකිත්සක | |
| 4 | විකිරණ ශිල්පී | |
| 5 | මහජන සෞඛ්‍ය පරීක්‍ෂක | |
| 6 | පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනී | |
| 7 | බන්තු රේඛන ශිල්පී | |
| 8 | විද්‍යුත් නිකර්පන රේඛන සටහන්කරු | |
| 9 | මහජන සෞඛ්‍ය රසායනාගාර ශිල්පී | |
| 10 | ඖෂධවේදී | |
| 11 | අක්‍ෂි තාක්‍ෂණවේදී | |
| 12 | දන්ත කාර්මික | |
| 13 | කීට විද්‍යා සහකාර | |
| 14 | පාසල් දන්ත චිකිත්සක | |

එක් එක් පුහුණු පාඨමාලාවන් සඳහා මගේ මනාපය ඉහත වගුවෙහි දක්වා ඇත. මෙම මනාප ප්‍රකාශය කිසිදු අයුරකින් යළි වෙනස් කළ නොහැකි බව මා දන්නා බවත්, මෙම මනාප ප්‍රකාශයට අමතරව කිසිඳු මනාප ප්‍රකාශයක් මා ඉදිරිපත් කර නොමැති බවත්, ඉහත සඳහන් පරිදි මා මනාප ප්‍රකාශයක් ඉදිරිපත් කලද එම මනාපය අනුව පුහුණු පාඨමාලාවන්ට ඇතුළත් කළ නොහැකි අවස්ථාවකදී පළමුව තේරීපත්වන හෝ සෞඛ්‍ය අමාත්‍යාංශය මා වෙත තෝරා දෙන පුහුණු පාඨමාලාවට ඇතුලත් වීමට මට සිදුවන බව මා දන්නා බවත්, එයට කිසිඳු අයුරකින් විරුද්ධත්වයක් නොදක්වන බවත්, ගැසට් නිවේදනයේ සඳහන් සියළු වගන්ති අවබෝධයෙන් යුතුව කියවා තේරුම්ගත් බවත් දිවුරා ප්‍රකාශ කරමි.

————,
(අයදුම්කරුගේ අත්සන)

ජා. හැ. අංකය :————.

දිනය : 2012 ————.

**සාමදාන විනිශ්චයකාර තැනගේ සහතිකය.**

මෙම මනාප ප්‍රකාශය ඉදිරිපත් කරනු ලබන ................................... මයා/මිය/මෙනවිය මා පෞද්ගලිකවම දන්නා හඳුනන බවද, ඔහු/ඇය ........................ දින මා ඉදිරිපිටදී අවබෝධයෙන් යුතුව ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බව ද සහතික කරමි.

————,
සාමදාන විනිශ්චයකාරතැනගේ අත්සන.

දිනය :————.

සාමදාන විනිශ්චයකාරතැනගේ සම්පූර්ණ නම :————.

ලිපිනය :————. සාමදාන විනිශ්චයකාරතැනගේ නිල මුද්‍රාව :————.

ආදර්ශ අයදුම්පත්‍රය

වෛද්‍ය කර්මය සඳහා වූ පරිපූරක වෘත්තීන්ගේ සේවාවේ හා අතුරු වෛද්‍ය සේවාවේ පුහුණුව සඳහා අභ්‍යාසලාභීන් බඳවා ගැනීම - 2012

අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර ගැසට් නිවේදනය හොඳින් කියවා බලන්න.

| පුහුණු පාඨමාලාවට අදාල සංකේත අංකය (ගැසට් නිවේදනයට අනුව) |
|---|
| |

* අයදුම් කරන පාඨමාලාව (සිංහලෙන්/දෙමළෙන්) :————.
* අයදුම් කරන පාඨමාලාව (ඉංග්‍රීසියෙන්) :————.

1. (අ) මුලකුරු සමඟ අගට යෙදෙන නම :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) - උදා ඃ A. B. C. SILVA
(ආ) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(ඇ) සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :————.

2. ජාතික හැඳුනුම්පත් අංකය : | | | | | | | | | | | (පිටපතක් අමුණන්න)

3. තැපැල් ලිපිනය ඃ සිංහලෙන්/දෙමළෙන් ඉංග්‍රීසියෙන්

| සිංහලෙන්/දෙමළෙන් | ඉංග්‍රීසියෙන් |
|---|---|
| ........................ | ........................ |
| ........................ | ........................ |
| ........................ | ........................ |
| ........................ | ........................ |

4. (අ) ස්ථිර ලිපිනය : සිංහලෙන්/දෙමළෙන් ඉංග්‍රීසියෙන්

| | |
|---|---|
| ......................... | ......................... |
| ......................... | ......................... |
| ......................... | ......................... |
| ......................... | ......................... |

(ආ) දුරකථන අංක : ජංගම : [ ] [ ] [ ] [ ] [ ] [ ] [ ] [ ] [ ] [ ] ස්ථාවර : [ ] [ ] [ ] [ ] [ ] [ ] [ ] [ ] [ ] [ ]

(ඇ) පදිංචි දිස්ත්‍රික්කය : සිංහලෙන්/දෙමළෙන් :—————. ඉංග්‍රීසියෙන් :—————.

(ඈ) ඔබ මෙම දිස්ත්‍රික්කය තුළ ස්ථිර පදිංචිකරුවෙක්ද? ඔව්/නැත :—————.

(ඉ) ඔව් නම් කොපමණ කලක පටන්ද? :—————.

5. උපන් දිනය : වර්ෂය :—————. මාසය :—————. දිනය :—————.
2012.07.09 වැනි දිනට වයස : අවුරුදු :—————. මාස :—————. දින :—————.

6. උස : අඩි :—————. අඟල් :—————.

7. ස්ත්‍රී/පුරුෂ භාවය : ස්ත්‍රී [ ] පුරුෂ [ ] (අදාළ කොටුවේ ✓ ලකුණ යොදන්න)

8. ඔබ ශ්‍රී ලංකාවේ පුරවැසියෙක්ද යන වග : ඔව් [ ] නැත [ ] (අදාල කොටුවේ ✓ ලකුණ යොදන්න)

9. විවාහක/ අවිවාහක බව : විවාහක [ ] අවිවාහක [ ]

10. අධ්‍යාපන සුදුසුකම් :

(අ) අ. පො. ස. (උ. පෙළ) විභාගය (Z අගය සහිත ප්‍රතිඵල ලේඛනයේ සහතික කළ පිටපතක් අමුණන්න)

විභාගයට ඉදිරිපත්වූ දිස්ත්‍රික්කය :—————.

විභාගයට පෙනී සිටි වර්ෂය :—————. විභාග අංකය :—————.

Z අගය :—————.

| # | විෂයය | සාමාර්ථය |
|---|---|---|
| 1 | | |
| 2 | | |
| 3 | | |
| 4 | | |

(ආ) අ. පො. ස. (සා. පෙළ) විභාගය (ප්‍රතිඵල ලේඛනයේ සහතික කළ පිටපතක් අමුණන්න)

| # | විෂයය | පළමුවර | | දෙවනවර | |
|---|---|---|---|---|---|
| | | වර්ෂය | | වර්ෂය | |
| | | විභාග අංකය | | විභාග අංකය | |
| | | සාමාර්ථය | | සාමාර්ථය | |
| 1 | සිංහල භාෂාව/දෙමළ භාෂාව | | | | |
| 2 | ගණිතය | | | | |
| 3 | විද්‍යාව | | | | |
| 4 | ඉංග්‍රීසි | | | | |
| 5 | | | | | |
| 6 | | | | | |
| 7 | | | | | |
| 8 | | | | | |
| 9 | | | | | |
| 10 | | | | | |
| 11 | | | | | |
| 12 | | | | | |

11. ඔබ කවරදාක හෝ කවර හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු වී තිබේ ද? ඔව් - ☐ නැත - ☐
(අදාළ කොටුවේ ✓ ලකුණ යොදන්න)
ඔව් නම් විස්තර සපයන්න. :————.

12. අයදුම්කරුගේ සහතිකය :

(අ) මා විසින් ගැසට් නිවේදනය හොඳින් කියවා බලා අවබෝධ කරගෙන එහි සඳහන් සියලු කොන්දේසි වලට යටත්ව මෙම අයදුම්පත සම්පූර්ණ කළ බවත්, මම වෙනත් කිසිඳු පූර්ණකාලීන පාඨමාලාවකට සහභාගි නොවන බවත්, මෙම අයදුම්පතෙහි මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බවත් ගෞරවයෙන් ප්‍රකාශ කර සිටිමි.

(ආ) මා විසින් කරන ලද මෙම ප්‍රකාශය හෝ අයදුම්පතෙහි සඳහන් කර ඇති කුමන හෝ තොරතුරක් අසත්‍ය යැයි ඔප්පු වුවහොත් මා පුහුණුවට නුසුදුස්සකු වන බව හා පත්වීම් ලදහොත් ඉන් අනතුරුව හෝ එසේ ඔප්පු වුවහොත් සේවයෙන් පහ කරනු ලැබීමට මා යටත් බව ද මම දැන සිටිමි.

මුද්දර

රු. 300

————,
අයදුම්කරුගේ/අයදුම්කාරියගේ අත්සන.

දිනය :————.

13. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ................................... මයා/මිය/මෙනවිය මා පෞද්ගලිකවම දන්නා හඳුනන බවද, ඔහු/ඇය ................. දින මා ඉදිරිපිට දී ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බව ද සහතික කරමි.

————,
සහතික කරන්නාගේ අත්සන.

දිනය :————.

————,
සහතික කරන්නාගේ නිල මුද්‍රාව

* සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :————.
* තනතුර :————.
* ලිපිනය :————.

06-75

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.